www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නසසපය, "සාම ක්‍රියාවලිය" සහ ශ්‍රී ලංකාවේ මැතිවරනය

## The NSSP, the "peace process" and the Sri Lankan elections

**සමාජවාදී සමානතා පක්ෂය**
**2004 මාර්තු 08**

ශ්‍රී ලංකාවේ මැතිවරනය තුල දී අතිශය නින්දිත ක්‍රියාකලාපයක් ඉටු කිරීමට නව සමසමාජ පක්ෂය (නසසප) පෙරට පැමින සිටී. කම්කරුවන්, තරුනයන් සහ බුද්ධිමතුන් අතර සැලකිය යුතු ස්ථරයක් ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකෙන් ම ගැඹුරු ලෙස දුරස්ථ වී සිටින තතු යටතේ, නසසපය සහ ඔවුන්ගේ "වාම" සගයෝ රනිල් වික්‍රමසිංහ සහ ඔහුගේ දක්ෂිනාංශික එක්සත් ජාතික පෙරමුන (එජාපෙ) ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග සහ ඇගේ හවුල්කරුවන්ට වඩා "අඩු නපුර" ලෙසට ඔසවා තබති.

කුමාරතුංග එජාපෙ ආන්ඩුව නෙරපා හැරීම සහ සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග සන්ධානගතවීම රට යලි සිවිල් යුද්ධයට ඇද දැමීමේ තර්ජනය මතු කරන බවට පැතිර පවතින කනස්සල්ල නසසප ය විසින් ගසාකනු ලබ යි. තව ද විවෘතව ම, පාර්ලිමේන්තු සම්මතයෙන් වෙන්වෙමින් සෘජුව ම වැඩි වැඩියෙන් බලතල ඇයගේ අතෙහි රඳවා ගැනීමේ අන්තරාය පවතී. නසසපයේ ක්‍රියාකලාපය වන්නේ ගරා වැටෙන නිල දේශපාලනයේ මන්දිරය මුක්කු ගසා ඔසවා තැබීම ද වැඩ කරන ජනතාව විප්ලවවාදී සමාජවාදී විකල්පයක් දෙසට හැරීමෙන් වලක්වාලීම ද වෙයි.

කුමාරතුංග විසින් පෙබරවාරි 7 දා එජාපෙ ආන්ඩුව නෙරපා හැරීමෙන් සිව් දිනකට පසුව නසසපය නව සන්ධානයක් පිහිටුවා ගැනීම - නව වාමාංශික පෙරමුන (නවාපෙ) - නිවේදනය කිරීම සඳහා කොලඹ දී පුවත් පත් සාකච්ඡාවක් පැවැත්වී ය. ප්‍රධාන ප්‍රකාශකයා වූයේ නසසප නායක ආචාර්ය වික්‍රමබාහු කරුනාරත්න ය. 1994 දී නසසපයෙන් බිඳී ගිය, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුනේ (ප්‍රවාපෙ) නායක වාසුදේව නානායක්කාර සහ මෑත දී ලසසපයෙන් බිඳී වෙන් වුන ලංකා සමසමාජ පක්ෂ (විකල්ප කන්ඩායම) නියෝජනය කල චන්ද්‍ර කුමාරගේ ද එයට සහභාගි විය. මෙම පක්ෂ තුන ම ව්‍යාජ ලෙස තමන් සමාජවාදීන් යයි කියා ගනිති.

නවාපෙ ඡේද හතරකින් යුතු මාධ්‍ය ප්‍රකාශය ප්‍රධාන පක්ෂ දෙක පිලිබඳ රූපික විවේචනයක යෙදෙයි. කුමාරතුංග "ජාතිවාදී, ආගමික කන්ඩායම් සහ මිලිටරි බලවේග" පීඩනයට "යටත් වූ" බව එහි ප්‍රකාශ කර තිබේ. අනෙක් අතට වික්‍රමසිංහ "මෙම හිතුවක්කාර පියවර වලක්වා ගැනීමට අසමත් වී" සහ "ගෝලීය ධනවාදයට හිස නමමින්" සිටී. ජනතාව "අන්තරායකර වර්ගවාදී ධනපති කඳවුරක්" සහ "ගෝලීය ධනවාදයේ පදයට නටන තවත් ධනපති කඳවුරක්" අතර සිරවී සිටී.

නවාපෙ "ජනතාව මුහුන පා සිටින කාලකන්නි තත්වයෙන් ගලවා ගැනීමේ බලවේගයන්" ගොඩනැගීමට තමන් කැප වී සිටින බව නිවේදනය කරයි. කෙසේ වෙතත් එම බලවේගය ජනතාව ම නොවේ. කම්කරු පන්තියේ කිසිදු ස්වාධීන ක්‍රියාකලාපයක් පැහැදිලිව ම ප්‍රතික්ෂේප කරමින් නවාපෙ අරමුන "සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන ලෙස පත්වන ආන්ඩුවට බලපෑම් ඇමීම" බව කරුනාරත්න මෙහි දී පැවසී ය. පෙරමුනේ අරමුන සාම ක්‍රියාවලිය පෙරට ගෙන යාම" බව ප්‍රවාපෙ නායක වාසුදේව නානායක්කාර ප්‍රකාශ කලේ ය. යථාර්ථයේ දී "සාම ක්‍රියාවලිය" ආරක්ෂා කිරීමේ නාමයෙන් මෙම පක්ෂ දෙක එක්සත් ජනතා නිදහස් සන්ධානයට වඩා යහපත් විකල්පයක් ලෙසට එජාපෙ ඔසවා තබමින් වඩ වඩාත් විවෘතව වික්‍රමසිංහට අවස්ථාව සලසා දෙති. එසේ කිරීමේ දී මොවුන් පාලක පන්තියේ සහ භූගෝලීය ප්‍රාග්ධනයේ උවමනාවන්ට කම්කරු පන්තියේ උවමනාවන් සෘජු ලෙස ම යටකර දමති.

ආන්ඩුවේ ආර්ථික ප්‍රති ව්‍යුහකරන සැලැස්මට එරෙහිව නැගී ආ වර්ජන සහ විරෝධතා රැල්ල මැඩලීමට ආන්ඩුවට උදව් කිරීමේ දී නසසප සහ ප්‍රවාපෙ අන් කොතැනකදීටත් වඩා එහි ක්‍රියාකලාපය පැහැදිලිව ප්‍රදර්ශනය විය.

වික්‍රමසිංහ ද ඇතුලු ආන්ඩුවේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරු ගනනාවක් ම ජනවාරි 5 දින පුද්ගලිකව හමු වූ අවස්ථාවේ දී ද ඉන් පසුව ද, නසසප සහ ප්‍රවාපෙ නායකයෝ කුමාරතුංග සමග ගැටුමේ දී ආන්ඩුවට සිය සහාය දීමට ද වර්ජන ව්‍යාපාරය සමග ගනුදෙනු කරන ආකාරය පිලිබඳව උපදෙස් දීමට ද ඉදිරිපත් වූහ.

ජනවාරි අවසානයේ අධිකාරියක් කිරීමට එරෙහිව 17,000ක් දුම්රිය කම්කරුවන්ගේ වැඩ වර්ජනයක් පුපුරා ගිය කල නසසපය නායකත්වය දෙන කුඩා කාර්මික සමිතියක් ආන්ඩුවේ සැලසුම් වසරකට කල් දැමීමට ද

සියලු කාර්මික වර්ජන අවසන් කිරීමට ද ආන්ඩුව සමග එකඟතාවකට අත්සන් තැබීමට අනෙකුත් එජාපෙ ගැති වෘත්තීය සමිති සමග එක්විය. ආන්ඩුවට "සාම ක්‍රියාදාමය" ඉදිරියට ගෙන යාමට ඉඩකඩ සලසා දෙනු වස් වර්ජනය නැවැත්වීම ඔහුගේ පක්ෂයේ "රාජකාරිය" බව පුවත් පත් සාකච්ඡාවක දී ප්‍රකාශ කරමින් නසසප නායක කරුනාරත්න එම තීන්දුව ආරක්ෂා කලේ ය.

මාර්තු 2 දා නවවාපෙ රැස්වීමක දී මෙසේ ප්‍රකාශ කරමින් කරුනාරත්න වික්‍රමසිංහට තමන් දෙන සහයෝගය යුක්ති සහගත කලේ ය: "සාමය ස්ථාපිත කිරීම සඳහා අපට මහසෝනා සමග වුව එක්වීමට සිදු වේ." වමේ ආන්ඩුවක් පිහිටුවිය නො හැකි නම් සාමය සඳහා කටයුතු කරන ආන්ඩුවක් තෝරා ගැනීමට ජනතාවට සිදුවේ යයි ඔහු පැවසී ය. "සාමය අවශ්‍ය සියලු දෙනා එකතු කරගෙන සාමය ස්ථාපිත කිරීමට පෙරට යන ලෙස අපි රනිල් (වික්‍රමසිංහ)ගෙන් ඉල්ලා සිටිමු."

## "සාම ක්‍රියාවලිය"

දශක දෙකක් තිස්සේ පැවති ආන්ඩු, කම්කරුවන් යුද්ධය වෙනුවෙන් පරිත්‍යාග කල යුතු යයි කියා සිටියේ ය. දැන් නවාපෙ කම්කරුවන්ට පවසන්නේ වික්‍රමසිංහ සහ එජාපෙට - මහසෝනා - සහයෝගය දෙනවා හැර ඔවුන්ට වෙන විකල්පයක් නැති බවත්, "සාමය" උදෙසා ඔවුන්ගේ ජීවන තත්වයන් කැප කල යුතු බවත් ය.

නවාපෙ විසින් එජාපෙ "සාම ක්‍රියාවලිය" සමග සාමය අවිවේචනාත්මකව අනන්‍ය කිරීම තුල කොලය වසා ගැසීමේ නින්දිත වූ උත්සාහයක් තිබේ. වික්‍රමසිංහගේ ම එක්සත් ජාතික පක්ෂය (යූඇන්පී) සිවිල් යුද්ධය පටන් ගත්තේ වුව ද එයට ජීවන තත්වයන් විනාශ කිරීමේ සහ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පාගා දැමීමේ දිගු ඉතාහාසයක් තිබෙන්නේ වුව ද කුමාරතුංගගේ ජවිපෙ-ශ්‍රීලනිප විසින් මතු කරනු ලබන අන්තරායන්ට ඇති එකම විකල්පය එජාපෙ බව ඔවුහු අඟවති. නවාපෙ සලකන ආකාරයට නම් මහ බලවතුන් සහ ව්‍යාපාරිකයන් යෝජනාවලට විරුද්ධව යුද්ධයට තමන්ගේ ම විසඳුමක් ඉදිරිපත් කිරීම කම්කරු පන්තියට කල නො හැක්කකි.

නවාපෙ ඉමහත් උද්ගතයකින් සහාය දෙන "සාම ක්‍රියාදාමය" කුමක් ද?

ආන්ඩුවට පිටුබලය සපයන විදේශීය රටවල් - එජ, ජපානය සහ යුරෝපීය බලවතුන් - වසර ගනනාවක් තිස්සේ ශ්‍රී ලංකාව තුල වන ලේ හැලීම් එක්කෝ නොතකා හැරියහ. නැතහොත් වර්ගවාදී යුද්ධය සඳහා ආන්ඩුවේ හමුදාවන්ට ක්‍රියාශීලිව සහාය දුන්හ. ඔවුන් විසින් දැන් "සාමය" උලුප්පා දැක්වීම ජනතාව පිලිබඳ මානුෂික හැඟීම් මත පදනම් නො වන අතර එය ගලා එන්නේ ඉන්දියානු උප මහාද්වීපය තුල වර්ධනය වන ආර්ථික සහ මූලෝපායික වැදගත්කමෙනි. 1990 ගනන්වල දී භූගෝලීය ආයෝජකයන් ඉන්දියාවට වහවැටුනේ එහි ලාභදායි හා උගත් ශ්‍රමයේ වාසිය ඩැහැගෙන කාර්යාල, පරිඝනක සහ තාක්ෂනික සේවාවන් මගින් විටෙක "ලෝකයේ කාර්යාලය" යයි නම් කෙරුන තත්වයට එම රට පරිවර්තනය කරනු සඳහා ය.

බුෂ් පරිපාලනය පිහිටුවීමෙන් පසුව සහ විශේෂයෙන් ම සැප්තැම්බර් 11 ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගෙන් අනතුරුව ඇමරිකාව ශ්‍රී ලංකාව තුල වඩාත් ඍජුව මැදිහත්වීම ආරම්භ විය. ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ නාමයෙන් ඇමරිකාව ඇෆ්ගනිස්ථානය ආක්‍රමනය කල අතර සම්පත් බහුල සහ මධ්‍යම ආසියානු කලාපයට යාබද මූලෝපායිකව වැදගත් කලාපය පුරාම, නවදිල්ලියේ හින්දු අධිපතිවාදී පාලන තන්ත්‍රය සමග සන්ධානගතව, සිය න්‍යාය පත්‍රය ක්‍රියාවට නැගීමට මාන බැලී ය.

කාශ්මීරයේ සහ නේපාලයේ දැනට පවතින කැරලිකාරිත්වය මෙන් ම ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය ද කලාපයේ තමන්ගේ අභිලාෂයන්ට බාධකයන් ලෙස ඇමරිකාව දකියි. දැනටමත් අතිශයින් ම චංචලව තිබෙන කලාපයේ, විශේෂයෙන් ම පරිඝනක තාක්ෂනයේ සහ සේවාවන්වල භූගෝලීය ආයෝජන බොහෝ සෙයින් ම සංකේන්ද්‍රිතව පවතින අසල්වැසි දකුනු ඉන්දියාව මෙම ගැටුම තුලින් තවදුරටත් අස්ථාවර වීම වලක්වා ගැනීම පිනිස බුෂ් පරිපාලනය, "සාම ක්‍රියාදාමයට" පිටුබලය ලබාදුන්නේ ය. ධවල මන්දිරය සාම ක්‍රියාවලියට සහයෝගය දෙන්නේ එය ඇමරිකානු උවමනාවන් හා ගැලපෙන තාක් දුරකට පමනකි. එල්ටීටීඊය "ත්‍රස්තවාදී සංවිධානයක්" ලෙස ඇමරිකාව විසින් නම් කර තිබීම, එල්ටීටීඊය එහි අන නො පිලිගතහොත් ලංකාවේ මිලිටරිය යලි අරඹන වඩා උත්සන්න වන යුද්ධයකට වොෂින්ටනය සිය සහාය දෙන්නේ ය යන පැහැදිලි තර්ජනය මතු කරයි.

ඉන්දියාව තුල ආයෝජන අවස්ථාවන්ගෙන් රට හුදෙකලා කර තැබීම යුද්ධය විසින් සිදු කරන්නේ යැයි නොසතුටට පත් ව්‍යාපාරිකයන් සහ මූල්‍ය අංශ ප්‍රධානීන් කොලඹ සිට "සාම ක්‍රියාදාමයට" සහයෝගය දෙති. ඔවුන්ගේ පෙලඹවීම මත වික්‍රමසිංහ සාම සාකච්ඡා ඉදිරියට ගෙන ගිය අතර භූගෝලීය ප්‍රාග්ධනයේ කලාපීය මධ්‍යස්ථානයක් - දකුනු ආසියාවේ සිංගප්පූරුවක් - බවට රට පත්කරලීම අරමුනු කර ගත් පුලුල් ආර්ථික ප්‍රතිසංස්කරන සැලැස්මක් පෙරට ගෙන ආවේ ය. 2002 පලමු සාකච්ඡා වටයේ දී ශ්‍රී ලංකාව, "ව්‍යාඝ්‍ර ආර්ථිකයක්" බවට පත්විය යුතු යයි ප්‍රකාශ කල එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම් ඊට සිය සංවිධානයේ උද්යෝගීමත් සහාය පලකලේ ය. එමනිසා ආරම්භයේ සිට ම "සාම ක්‍රියාදාමය" එල්ල වී තිබෙන්නේ ජනතාවගෙන් බහුතරයක අවශ්‍යතාවන්ට සහ ප්‍රාර්ථනයන්ට එරෙහිව ය. බලය බෙදා ගැනීමේ එකඟතාවක් සඳහා තරගවැදී සිටින පාලක ප්‍රභූවේ කොටස් - සිංහල දෙමල සහ මුස්ලිම් - අතර දොරගුලු ලාගත් සාකච්ඡා පැවැත්විනි. සාකච්ඡාවල ව්‍යුහය ශ්‍රී ලංකාවේ නිල දේශපාලනයේ

පැතිර පවතින වර්ගවාදයේ ම ප්‍රකාශනයකි.

අවසන් එකඟතාවයක් කෙසේ වෙතත් එවැන්නක් යෝජනා වී හෝ නොමැත. එහෙත් උතුරු-නැගෙනහිර අන්තර් පරිපාලනයක් සඳහා වන විවිධ සැලසුම් ද සාකච්ඡාවල දී පැවතුන ආකාරයේ ම ප්‍රජාතන්ත්‍ර විරෝධී සහ වර්ගවාදී අංග ලක්ෂන ඇතුලත් කර ගනී. ආන්ඩුව මෙන් ම එල්ටීටීඊය ද ඒ ඒ ජනවර්ගයේ ප්‍රමානය පිලිබිඹු කෙරෙන වට්ටෝරුවකට අදාලව තෝරා ගැනුනු සිංහල, මුස්ලිම් හා දෙමල නියෝජනයන්ගෙන් සැදුම්ලත් මන්ඩලයක් පිහිටුවීමට යෝජනා කර තිබේ. යෝජිත පරිපාලනය අටවනු ඇත්තේ කිසිදු මහජන ඡන්දයකින් තොරව ය. එවන් සැකැස්මක් වාර්ගික ආතතීන් අවසන් කරනවා වෙනුවට වාර්ගික සහ ආගමික බෙදීම් සංස්ථාගත කරනු ඇත. එසේම එය සාමය සඳහා නො ව අනාගත ගැටුම් සඳහා මග විවර කරනු ඇත.

### නවාපෙ "සිවිල් බලවේගය"

පසුගිය මස පුවත් පත් සාකච්ඡාවේ දී නවාපෙ, "සාම ක්‍රියාදාමය ආරක්ෂා කර ඉදිරියට ගෙනයෑම" සඳහා "සිවිල් බලවේගයක්" ගොඩනැගීම පිනිස "සියලු වාමාංශික ප්‍රගතිශීලි පක්ෂවලට සහ නායකයන්ට" කැඳවුම් කලේ ය. මෙම සිවිල් බලවේගය, "ජනතාවගේ නිදහස සහ ප්‍රජාතන්ත්‍රය ආරක්ෂා කිරීමට" සහ "විදේශ බලවේගවල යකඩ සපත්තුවෙන් ජනතාවගේ ජීවන කොන්දේසි ආරක්ෂා කිරීමට" ද අවශ්‍ය වන්නේ ය.

නවාපෙ ආයාචනය කරන්නේ කාටද? මෙම .සිවිල් බලවේගය" කවරක් ද? "ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සහ ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය (කොප) මෙම පෙරමුනට එක් වෙතැයි අපි බලාපොරොත්තු වෙමු" යයි පුවත් පත් නිවේදනය කියා සිටියේ ය. කෙසේ වුව ද දින ගනනක් තුල දී මෙම පැරනි "කම්කරු" පක්ෂ ජවිපෙ-ශ්‍රීලනිප ට එක්විය. එනම්, නවාපෙ "අන්තරායකාරී ජාතිවාදී ධනවාදී කඳවුර" යයි හංවඩු ගැසූ උදවිය සමග ඔවුන් විවෘතව ම එක්විය.

අතීතයේ දී නම් නසසපය සහ ප්‍රවාපෙට තමන්ගේ උද්ඝෝෂන සඳහා සහාය ලබා ගැනීමට ඔවුන්ගේ ම වෘත්තීය සමිති මෙවලම යොදා ගත හැකිව තිබුනි. එහෙත්, වෙනත් රටවල මෙන් ම ලංකාවේ ද වෘත්තීය සමිති ආර්ථික ප්‍රතිව්‍යුහකරනයේ සහ පෞද්ගලීකරනයේ න්‍යාය පත්‍රය පැටවීමට ආන්ඩුවලට සහාය දීමේ දී තීරනාත්මක විය. දශක ගනනාවක් තිස්සේ කල පාවාදීම් කම්කරුවන්ගේ පිලිකුලට පාත්‍ර විය. නසසපයේ සහ ප්‍රවාපෙ ම නීච වාර්තාව ඔවුන්ට පෙර තිබූ සැලකිය යුතු වෘත්තීය සමිති පදනම තත්‍ය ලෙස ම බිඳ දමනු ලැබී ය.

සිවිල් බලවේගයක් සඳහා වන නවාපෙ ආයාචනය යොමුව ඇත්තේ වෙනත් අරමුනකට ය: එනම්, මෑත දශකවල දී ලංකාව තුල පැන නැගුනු රාජ්‍ය නො වන සංවිධාන (එන්ජීඕ) ගොඩ දෙසට ය. මෙම සංවිධාන ඊනියා තුන්වන ලෝකය පුරා, විශේෂයෙන් ම වෘත්තීය සමිති, ධනේශ්වර ජාතික සහ ප්‍රතිසංස්කරනවාදී පක්ෂ වැනි පැරනි ආරක්ෂිත කපාටයන් වියැකී යාමෙන් අනතුරුව ඉස්මත්තට පැමිනි පෘථුල ජාත්‍යන්තර ජාලයක කොටසකි. එන්ජීඕ තමන් කම්කරු පන්තික සංවිධාන බවට කිසිදු මවාපෑමක් නො කරන අතර ඒවා දේශීය ධනේශ්වරයේ සහ ප්‍රධාන අධිරාජ්‍යවාදී මධ්‍යස්ථානවල කොටස් විසින් ඍජුව හෝ වක්‍රව සහයෝගය සහ අරමුදල් සපයනු ලබන අට්ටාලයන් ය. එන්ජීඕවන් විවිධ වර්ගයේ සහායක අරමුනු වැලඳගෙන සිටිය ද ඔවුන්ගේ ප්‍රධාන කාර්යභාරය ලංකාව වැනි රටවල පුපුරනසුලු සමාජ සහ පන්ති ආතතීන් එලිපිට ම විප්ලවවාදී දිශාවකට හැරීම වලක්වාලීම ය.

එන්ජීඕ ගනනාවක් සමග, විශේෂයෙන් ම "සාම ක්‍රියාදාමය" අලෙවි කිරීමට උදව්වීම පිනිස පිහිටවනු ලැබූ ඒවා සමග නසසපයට සහ ප්‍රවාපෙට සබඳතා තිබේ. මේ අතර ශ්‍රී ලංකාවේ ජාතික සාම කවුන්සිලය සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ද වේ. මේ ආයතන දෙකට ම දේශීය ව්‍යාපාරික කොටස් ද ඇතුලුව දේශීය හා විදේශීය ආයතන බොහෝ ගනනක් සමග සමීප සබඳතා තිබේ. ජාතික සාම කවුන්සිලයට ඇමරිකාවේ, ජපානයේ, නෝර්වේ සහ අනෙකුත් යුරෝපා සංගමයට අයත් ආන්ඩුවල ආධාර සංවිධානවලින් අරමුදල් ලැබේ. ආරම්භයේ දී ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රශ්නවලට පමනක් සීමා වූ සර්වෝදය වැනි අනෙකුත් එන්ජීඕවන් තමන්ගේ ම සාම සැලසුම් අරඹා තිබේ. සර්වෝදයට ඇමරිකාව සහ යුරෝපය ඇතුලු රටවල් 35කින් අරමුදල් ලැබේ.

ශ්‍රී ලංකාවේ කුඩා සහ විශාල එන්ජීඕ 400ක් පමන ඇතුලත් මෑතක දී පිහිටුවා ගන්නා ලද සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා වන ජාතික ව්‍යාපාරය (එන්එම්පීඩී) තුල නසසපය හා ප්‍රවාපෙ ක්‍රියාශීලිව සම්බන්ධ වී සිටියි. නසසප නායක කරුනාරත්න ප්‍රවාපෙ සාමාජිකා නිමල්කා පෙරේරා එහි සංවිධායක ලේකම් මන්ඩලයේ කොටස්කරුවන් ය. එහි ප්‍රධාන අරමුනුවලින් එකක් වනුයේ දක්ෂිනාංශික එජාපෙ ද ඇතුලුව සාම ක්‍රියාදාමයට සහාය දෙන සියලු කන්ඩායම්වලට පොදු වේදිකාවක් සපයා දීම ය. පෙබරවාරි අග දී පැවති එන්එම්පීඩීයේ ප්‍රසිද්ධ රැලියක දී කරුනාරත්න සහ ප්‍රවාපෙ නායක නානායක්කාර අගමැති වික්‍රමසිංහ සමග එකට පෙනී සිටියහ. එහි දී ඔවුන් යලි වතාවක් සිය "වාම" අක්ත පත්‍ර වික්‍රමසිංහට සාමයේ දූතයෙකු ලෙස පෙනී සිටීම සඳහා නයට දුන්නෝ ය.

### ව්‍යසනයන්ගේ ඉතිහාසයක්

නසසපයට අවස්ථාවාදී කූටෝපායන්ගේ දිගු ඉතිහාසයක් තිබේ. ඒ සියල්ලම කම්කරු පන්තියට විනාශකාරී ප්‍රතිඵල ගෙන ආවේ ය. මොවුන්ගේ මූලධර්ම විරහිත දේශපාලනයේ මුල් පවත්නේ 1964 දී තම ට්‍රොට්ස්කිවාදී පදනම් විවෘතව ම පසෙකට ලා කුමාරතුංගගේ මව වන සිරිමා බන්ඩාරනායක

නායකත්වය දුන් ධනේශ්වර ආන්ඩුවට ඇතුලු වූ ලසසපය තුල ය.

කරුනාරත්න සහ නානායක්කාර ඇතුලු නසසපයේ මූලාරම්භකයෝ දශකයකටත් වැඩි කලක් ලසසපය තුල ලැග සිටියහ. 1971 ගම්බද සිංහල තරුන නැගිටීමක් මුර්ග ලෙස මර්දනය කල හා 1972 දී සිංහලය රාජ්‍ය භාෂාව සහ බුද්ධාගම රාජ්‍ය ආගම ලෙස කිරුලු පැලැන්දූ වර්ගවාදී ව්‍යවස්ථාවක් සම්පාදනය කලා වූ ද, 1970 දෙවන බන්ඩාරනායක ආන්ඩුවට ලසසපය එක්වන විට ද ඔවුහු ඒ තුල සිටියහ. ඔවුන් භේද වූයේ 1976 දී බන්ඩාරනායක ලසසපය පාලක සභාගයෙන් නෙරපා හැරීමෙන් අනතුරුව පමන ය.

නසසපය ලසසපයෙන් ඉවත්වීම කුමන ආකාරයේ හෝ මූලධර්මාත්මක පදනමක සිදුවූවක් නො වේ. ආරම්භයේ පටන් ම නසසපයට මග පෙන්වූයේ ද ලසසපයේ පාවාදීමට මගපෑදූ මූලික දේශපාලනික යොමුවම ය. ශ්‍රීලනිපය හෝ එජාප යන ප්‍රධාන ධනපති පක්ෂ දෙකින් එකකට බලපෑම් දැමීමට සීමාවී සිටින්නා වූ නසසපය, කරවටක් වර්ගවාදයේ ගිලී තිබෙන්නා වූ ලංකාවේ නිල දේශපාලන රාමුවට මුලුමනින් ම අනුගතව සිටිති.

1983 සිවිල් යුද්ධය අවුලුවාලීමට වගකිවයුතු වූ ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ එජාප ආන්ඩුව වැඩී ආ පන්ති අරගලයන්ට ද ගැටුම් නවතාලීම සඳහා ඉන්දියාවේ බලපෑමට ද 1986 දී මුහුන දී සිටියේ ය. ජයවර්ධන ඊනියා කම්කරු පන්තික පක්ෂ වූ ලසසපය, කොපය සහ නසසපයෙන්, යුද්ධය අවසන් කිරීමේ සහ වර්ජන හා විරෝධතා මැඩලීමේ මාවතක් සොයා ගැනීමට සහාය වන ලෙස ඉල්ලා සිටියේ ය.

මොවුන් තුන්ගොල්ලම 1986 ජුනියේ දී කැඳවනු ලැබූ වට මේස සාකච්ඡාවට එක් වූ අතර 1987 ජුලියේ ඉන්දු-ලංකා ගිවිසුමට මුල් වූ මාසයක් තිස්සේ පැවති සාකච්ඡාවන්ට සහභාගි වූහ. නසසප නායක කරුනාරත්න එකල දී ගිවිසුම "ප්‍රගතිශීලි පියවරක්" සහ "බටහිර බලවතුන්ට එරෙහි ප්‍රහාරයක්" ලෙස ආවැඩී ය.

ගිවිසුම යටතේ ඉන්දියානු හමුදා එල්ටීටීඊය නිරායුධ කිරීම සහ නව පලාත් සභා ව්‍යුහයක් වෙත සීමිත බලය විමධ්‍යගත කිරීමක් අධීක්ෂනය කිරීම සඳහා "සාම දූතයන්" ලෙස උතුරට සහ නැගෙනහිරට යවන ලදී. මුල දී ගිවිසුමට එකඟ වූ එල්ටීටීඊය ඉක්මනින් ම උතුරේ දී ඉන්දියානු හමුදා සමග දිග්ගැස්සුනු ලේවැකි ගැටුමකට අවතීර්න විය. ගිවිසුම දකුනේ දී දේශපාලන සංස්ථාපිතය තුල තියුන වෙනස්කම් ද "ඉන්දියානු අධිරාජ්‍යවාදය" හෙලාදුටු සහ ද්‍රෝහීන් ලෙස ආන්ඩුවට චෝදනා කල ජවිපෙ උමතු ස්වෝත්තමවාදී උද්ඝෝෂනයක් අවුලුවාලී ය. සිය කඳවුර තුලින් ම නැගී ආ විරෝධයකට මුහුන දුන් එජාප ආන්ඩුව එයට අනුගතවෙමින් සිටියේ ය. ජනාධිපති රනසිංහ ප්‍රේමදාස යටතේ ආන්ඩුව, සියල්ලටත් වඩා කම්කරු පන්තියට එරෙහිව එල්ල කෙරුනු රහස් සන්ධානයක් ජවිපෙ සමග අටවාගත්තේ, ඉන්දියානු හමුදාවට පිටවී යාමට බලකෙරෙන තත්වයක් නිර්මානය කරලීම සඳහා එල්ටීටීඊයට හොර රහසේ සහයෝගය ද දෙන අතරවාරයේ ම ය. දකුනේ දී සිය "දේශප්‍රේමී" උද්ඝෝෂනයට සහාය නො දෙන ඕනෑම අයකුට එරෙහිව ත්‍රස්තයේ බලය යොදාගත් ජවිපෙ සමග මිලිටරිය අත්වැල් බැඳගෙන වැඩට බැස්සේ ය. 1980 ගනන් අගභාගයේ දී කම්කරු පන්තිය බියවැද්දීම පිනිස සන්නද්ධ කල්ලි සිය ගනනක් කම්කරුවන් වෘත්තීය සමිති ක්‍රියාකාරීන් හා දේශපාලන නායකයන් අමුඅමුවේ ඝාතනය කලහ.

කම්කරුවන්ට ප්‍රහාර එල්ල කිරීමට ජවිපෙය යොදාගත් ප්‍රේමදාස පසුව ඔහුගේ පැරනි මිතුරන් වෙතට හැරුනු අතර ජවිපෙ නායකයින් හා සාමාජිකයන් නිර්දය ලෙස ඝාතනය කලේ ය. අනතුරුව ප්‍රේමදාස සෘජු මිලිටරි මැදිහත්වීමෙන් හෝ ඔවුන්ගේ ඝාතන කල්ලි මගින් 60,000ක් යැයි ගනන් බලන ලද තරුනයන් සංහාරය කල විෂඝෝර ව්‍යාපාරයක් දකුනේ සමස්ත ග්‍රාමීය ජනයාට එරෙහිව දියත් කලේ ජවිපෙ දඩමීමා කරගෙන ය. වර්තමාන අගමැති රනිල් වික්‍රමසිංහ එවක එජාපයේ ජ්‍යෙෂ්ඨයෙකු හා කර්මාන්ත ඇමතිව සිටි බව මතකයට නැංවිය යුතු ය. ප්‍රේමදාසගේ ජනසංහාරක ව්‍යාපාරයන්ට ක්‍රියාශීලිව සහයෝගය දැක්වීම පිලිබඳව ඔහුට චෝදනා එල්ලව තිබේ.

1990 ගනන් මුල දී යුද්ධයට මෙන් ම එජාප ආන්ඩුවට එරෙහි විරෝධය වැඩෙන විට ලසසපය සහ කොපය හා එක්ව නසසපය 1994 මැතිවරනයේ දී කුමාරතුංග සහ ඇගේ ශ්‍රීලනිපය පිටුපසින් රැලිවූහ. මේ සියලු "වම්මුන්" සාමය, ප්‍රජාතන්ත්‍රවාදය සහ වඩා යහපත් ජීවන කොන්දේසි පිලිබඳ ඇගේ පොරොන්දු ඇදහිය හැකි ය යන මායාව වැපිරූහ. මේ තත්වයේ දී නසසපය සුලු උපායාත්මක ප්‍රශ්න මත භේද විය. නානායක්කාර නායකත්වය දුන් කොටසක් කුමාරතුංගගේ පොදු පෙරමුන සමග එක් වූ අතර ඉන් නෙරපනු ලැබූන කල ප්‍රවාපෙ අටවා ගත්හ. කරුනාරත්න යටතේ වූ නසසප කන්ඩායම තරමක් දුරින් සිටීමට වඩා කැමති විය.

කුමාරතුංග ඇගේ කිසිදු පොරොන්දුවක් ඉටු නො කලා ය. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සමග සාකච්ඡා බිඳ වැටුන විට ඇය "සාමය සඳහා යුද්ධය" නම් මූලෝපායක් වැලඳ ගත්තා ය. වෙනත් වචනවලින් නම් එල්ටීටීඊය විනාශ කර දැමීමට හෝ ඇගේ කොන්දේසි මත ඔවුන් සාකච්ඡා මේසයට කැඳවා ගැනීමට බලකෙරෙන සටන උත්සන්න කලා ය. 1994 සිට 2001 දක්වා වූ පොදු පෙරමුන බලයේ සිටි කාලයේ දී ඊට පෙර දශකයේ එජාප ආන්ඩු යටතේ දීට වඩා මිනිසුන් ගැටුමෙන් මිය ගියහ. කුමාරතුංග යුද්ධය උත්සන්න කලා පමනක් නො ව ආර්ථික ප්‍රතිව්‍යුහකරනය පිලිබඳ ජාමූඅ ඉල්ලීම් ක්‍රියාවට දමා

මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් ද පාගා දැමුවා ය.

ආන්ඩු විරෝධය ඉහල යද්දී, 1998 දී කරුනාරත්නගේ නසසපය තවත් සන්ධානයක් ඇටවී ය. ඒ 1980 ගනන් අග භාගයේ දී නසසප සාමාජිකයන් ඝාතනය කල පක්ෂය වූ ජවිපෙ සමග ය. ජවිපෙ බෝම්බ ප්‍රහාරයකින් කරුනාරත්නමත් මරනාසන්න විය. එසේ වුව ද නසසපයට අනුව ජවිපෙහි මූලික වෙනසක් ඇතිව තිබුනි. අද ඔවුන්, "ජාතිවාදී" ආගමික කන්ඩායම්වාදී සහ මිලිටරිවාදී බලවේග " වල කොටසක් ලෙස හෙලා දකිනු ලබන නසසපය විසින් ජවිපෙ "සමාජවාදීන්" ලෙස ඔසවා තැබුනු අතර ඔවුන්ට කොලඹ කම්කරු පන්තිය ඇතුලත වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට ද උදව් දුන්නේ ය.

2000 වසරේ දී ශ්‍රී ලංකා හමුදාව එල්ටීටීඊය වෙතින් විනාශකාරි මිලිටරි පරාජයන් මාලාවක් ලැබීමෙන් පසුව නසසප-ජවිපෙ සභාගය වේගයෙන් බිඳ වැටුනි. ඇගේ මිලිටරි මූලෝපාය බිඳවැටීමෙන් පසු කුමාරතුංග, එල්ටීටීඊය සමග සාකච්ඡාවන්ට පදනමක් ලෙස උතුරු-නැගෙනහිරට බලය විමධ්‍යගත කිරීමකට ඉඩකඩ සලසන ව්‍යවස්ථා සංශෝධනයක් යෝජනා කරමින් සාම සාකච්ඡා යලි ඇරඹීමට නැවතත් වැයම් කලා ය. එල්ටීටීඊයට එරෙහිව අවසන් යුද්ධයක් වෙනුවෙන් හඬනැගූ සිංහල ස්වෝත්තවමාදීන් සමග ජවිපෙ එක්වූහ. නසසපය සාම සාකච්ඡාවන්ට සහාය දෙන ලෙස පාලක පක්ෂවලට ආයාචනා කලේ ය.

වර්තමාන "සාම ක්‍රියාදාමය" අසාර්ථකවීමට හේතු වූ කරුනු ම කුමාරතුංගගේ සැලසුම් බිඳ වැටීමට ද හේතුකාරක විය. ආරම්භයේ දී පොදු පෙරමුනේ ව්‍යවස්ථා සංශෝධනයන්ට සහාය දීමට ඉදිරිපත් වූ වික්‍රමසිංහ සහ එජාපය, යෝජනාවන් සිංහල ජාතිය පාවාදෙන්නේ යයි හෙලා දුටු ජවිපෙ සහ අනෙකුත් සිංහල අන්තවාදීන්ගේ පීඩනයට හසු විය. පාර්ලිමේන්තුවේ දී බලය බෙදීමේ පැකේජයට විරුද්ධව හඬනැගීමට එජාපය ජවිපෙ කෙලතොල්ලන් හා එක්විය. අවශ්‍ය තුනෙන් දෙකේ බහුතරය නො ලද්දේ කුමාරතුංග පැකේජය ඉවත් කර ගත්තා ය.

ඔවුන්ගේ ජාතික ප්‍රතිසංස්කරනවාදී වැඩපිලිවෙලේ ආර්ථික පදනම් මුලුමනින් ම බිඳවැටී ඇති හෙයින් කම්කරු පන්තිය ප්‍රධාන පක්ෂවලට යටත් කර තැබීමේ නසසප වැයම් අද දින සුවිශේෂිතව විසුලු ස්වභාවයක් ගනී. නසසපය අනුගතවීමට මාන බලන සියලුම ධනේශ්වර පක්ෂ ජනතාවගේ උවමනාවන්ට ප්‍රතිවිරෝධී වූ පිලිවෙත්වලට ඇපකැප වී සිටිති. පාර්ලිමේන්තුව සහ ප්‍රධාන පක්ෂ දෙක වටා භ්‍රමනය වූ ශ්‍රී ලංකාවේ ධනේශ්වර දේශපාලනයේ සමස්ත අට්ටාලය ම කඩා වැටීමේ සන්තතියක් තුල ගිලී තිබේ.

එක එකා තම තමන්ගේ ක්‍රමෝපායන්ගෙන් දේශපාලන සංස්ථාපිතයට මුක්කු ගැසීමට වැයම් කිරීමේ දී අවස්ථාවාදී "කම්කරු" පක්ෂ අතර ශ්‍රම විභජනයක් තිබේ. නසසපයේ නවාපෙ "අඩු නපුර" ලෙස වික්‍රමසිංහට සහයෝගය දෙන ලෙස කම්කරුවන් හා සෙසු කොටස් දිරිගන්වන්නේ ඔහුගේ එජාපෙ කම්කරු පන්තියේ සාමාජිකත්වයන් තව තවත් කාබාසිනියා කිරීමට ඇපකැප වී සිටියදී ය. ඒ සමග ම, ලසසපය සහ කොපය රට යලි යුද්ධයට ඇද දැමීමට තර්ජනය කරන කුමාරතුංග සහ ජවිපෙ-ශ්‍රීලනිප සන්ධානයේ විවෘත ස්වෝත්තමවාදී උද්ඝෝෂනය සමග එක්ව සිටිති.

පාලක පන්තියේ සියලු කොටස්වලට සහ ඔවුන්ගේ ඉඳුල් භක්ෂකයන්ට එරෙහිව තමන්ගේ පන්ති උවමනාවන් සඳහා සටන් වැදීමට සමාජවාදී ක්‍රියාමාර්ගයක් සහ තමන්ගේ ස්වාධීන පක්ෂයක් වර්ධනය කර ගැනීමට නසසපයේ අවස්ථාවාදී උපාමාරුවලින් අවශ්‍ය පාඩම් උකහා ගැනීමට කම්කරු පන්තියට සිදු වී තිබේ. ශ්‍රී ලංකාව තුල එවන් සමාජවාදී විකල්පයක් සඳහා සටන් වදින එකම පක්ෂය සමාජවාදී සමානතා පක්ෂය යි. එහි පෙර ගමන්කරුවා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය 1968 දී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ලංකා ශාඛාව ලෙස ස්ථාපිත කරනු ලැබුවේ ලසසපයේ පාවාදීම්වලට එරෙහිව කරනු ලැබූ දේශපාලන හා න්‍යායික අරගලයකිනි. විකොස/සසප ජාතිවාදී සිවිල් යුද්ධයට සහ සියලු ආකාරයේ ජාතිවාදයන්ට සහ ස්වෝත්තමවාදයන්ට ආරම්භයේ සිට ම විරුද්ධ විය. ජාත්‍යන්තරව හා ඉන්දියානු උපමහාද්වීපය පුරා සමාජයේ සමාජවාදී පරිවර්තනයක් ඇති කිරීමේ කොටසක් ලෙස ශ්‍රී ලංකා - ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් පිහිටුවීමේ දී කම්කරු පන්තිය වෙතට බලය ලබාගැනීමේ පදනම ලෙසින් එහි දේශපාලන ස්වාධීනත්වය සඳහා පක්ෂය නිරතුරුව සටන් වැද තිබේ.

© www.wsws.org